Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# නාවලපිටිය නගර සභාවේ රියැදුරු (ප්‍රාථමික ශිල්පීය) තනතුරේ පුරප්පාඩු පිරවීම

නාවලපිටිය නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ තනතුරුවලට බඳවා ගැනීමට නාවලපිටිය නගර සභා බල ප්‍රදේශයේ හා ආසන්න බලප්‍රදේශවල පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| රියැදුරු | 03 |

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*

01.1 බඳවා ගන්නා අනුපාතය :

| *ධාරාව* | *ප්‍රතිශතය* |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |

01.2 *විවෘත බඳවා ගැනීම* :

01.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

01.2.2. සුදුසුකම් :

01.2.2.1 *අධ්‍යාපන සුදුසුකම්* : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එක් වරකදී සමත්වී තිබිය යුතුයි.

01.2.2.2 *වෘත්තීය සුදුසුකම්* : මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ පහත තනතුර සඳහා අදළ වන කාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.

| තනතුරු නාමය | සම්පූර්ණ කළ යුතු සුදුසුකම් |
|---|---|
| රියැදුරු | තාර බර හොන්ඩර් 34ට වැඩි බර මෝටර් වාහන බර ටේලර් සහ මඟීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම. (බඳවා ගන්නා දිනට අවම වශයෙන් වසර 03කට පෙර, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් 2009.03.11 දිනට පෙර නිකුත් කරන ලද 'ඒ' වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'ඩී' පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.) |

01.2.2.3 *පළපුරුද්ද* : මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03ක පළපුරුද්ද ලබා තිබීම (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය).

01.2.2.4 *කායික සුදුසුකම්* :

(i) සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(ii) අවම උස අඩි 05 අඟල් 02, 1/2ක් විය යුතුය.

01.2.2.5 *වෙනත්* :

(i) පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ii) අයදුම්කරු නාවලපිටිය නගර සභා බලප්‍රදේශය තුළ හෝ ආසන්න පළාත් පාලන ආයතන බල ප්‍රදේශ තුළ පදිංචිකරුවන් විය යුතුය. වසර 03කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුයි.
(iii) මහාමාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය.
(iv) බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
(v) යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

01.2.3 *වයස* :

01.2.3.1 අවම සීමාව : අවුරුදු 18යි.
01.2.3.2 උපරිම සීමාව : අවුරුදු 45යි.

01.2.4 *බඳවා ගැනීමේ ක්‍රමය* : ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

01.2.4.1 ලිඛිත විභාගය : 02 වන පරිශිෂ්ටයේ සඳහන් පරිදි ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් පවතින පුරප්පාඩු මත වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

01.2.4.2 වෘත්තීය පරීක්ෂණය :

| පරීක්ෂා කර ලබාදෙනු ලබන ශීර්ෂ | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. රිය පැදවීමේ නිපුණතාවය/යන්ත්‍ර ක්‍රියාකරවීමේ නිපුණතාවය | 40 | ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40% හෝ ඊට වැඩියෙන් ලබා ගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබීමෙන් පසු ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. |
| 02. මහා මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | |
| 03. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | |
| මුළු ලකුණු සංඛ්‍යාව | 100 | |

01.3. *සීමිත බඳවා ගැනීම* :

දැනටමත් අදළ පළාත් පාලන ආයතනයේ තනතුරක ස්ථිර කර ඇති මූලික සුදුසුකම් සපුරා ඇති සේවකයන් සඳහා අදළ වේ.

01.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය. III ශ්‍රේණිය

01.3.2 සුදුසුකම් :

01.3.2.1 අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටතේ පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයන් 05ක් එක් වරකදී සමත්වී තිබිය යුතුයි.

01.3.2.2 වෘත්තීය සුදුසුකම් : මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ පහත තනතුර සඳහා අදල වන කාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.

| තනතුරු නාමය | සම්පූර්ණ කළ යුතු සුදුසුකම් |
|---|---|
| රියදුරු | තාර බර හොන්ඩර් 34ට වැඩි බර මෝටර් වාහන බර ටේලර් සහ මඟින් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙනයාහැකි බස්රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම. (බඳවා ගන්නා දිනට අවම වශයෙන් වසර 03කට පෙර, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් 2009.03.11 දිනට පෙර නිකුත් කරන ලද 'ඒ' වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'ඩී' පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම. |

)

01.3.2.3 පළපුරුද්ද : මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03ක පළපුරුද්ද ලබා තිබීම. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)

01.3.2.4 කායික සුදුසුකම් :

(i) සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේදී සහ රාත්‍රි කාලයේදී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
(ii) අවම උස අඩි 05 අඟල් 02, 1/2ක් විය යුතුය.

1.3.2.5 වෙනත් :

(i) අයදුම්කරු අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ වසර 3 කට නොඅඩු ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි.
(ii) මාර්ග නීති හා මාර්ග සංඥා පිළිබඳ මනා දැනුමකින් යුක්ත විය යුතුයි.
(iii) බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුයි.

01.3.3 වයස :

01.3.3.1 අවම සීමාව : අවුරුදු 18යි.
01.3.3.2 අදාළ පළාත් පාලන ආයතනයේ සේවයේ යෙදී සිටින අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

01.3.4 බඳවා ගැනීමේ ක්‍රමය :

කායික මානසික යෝග්‍යතාවය සහ අධ්‍යාපන, වෘත්තීය හා පොදු සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සමඟ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් ලබා ගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබන්නන් මෝටර් රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයක දී සුදුසුකම් ලබාගත යුතුය.

| පරීක්ෂා කර ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. රිය පැදවීමේ නිපුණතාවය | 40 | ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40% හෝ ඊට වැඩියෙන් ලබාගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අවශ්‍ය සියළුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබීමෙන් පසු ඉහළම ලකුණු ලැබුවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. |
| 2. මහා මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | |
| 3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | |
| මුළු ලකුණු සංඛ්‍යාව | 100 | |

01.4 *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි* :

01.4.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුයි.)

01.4.2 වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දයක විය යුතුය.

01.4.3 වැටුප් :

01.4.3.1 වැටුප් කේතය : PL-3-2016

01.4.3.2 වැටුප් පරිමාණය : රා. ප. ච. 03/2016 අනුව රු. 25,790-270x10-300 x 10-330 x 10-350 x 12- රු. 38,990 (2020.01.01 දින සිට මෙම වැටුප් පරිමාණයට එළඹේ.)

2019.01.01 දින සිට මූලික වැටුප : රු. 23,126 ක් හා ගැලපුම් දීමනාව : රු. 1965 ක් ගෙවනු ලැබේ.

01.5. *අයදුම් කළ යුතු ආකාරය* :

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි ''12 x 8'' ප්‍රමාණයේ අයදුම්පත් සකස් කරන තනතුර අදළ කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා 2019.07.26 වැනි දිනට පෙර ''ලේකම්, නගර සභාව, නාවලපිටිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයගේ අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.) නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් සමග පහත ලියකියවිලි වල සහතික කළ පිටපත් එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික,
3. හැඳුනුම්පතේ ඡායා පිටපතක්,
4. පදිංචිය සනාත කිරීමේ ග්‍රාම නිලධාරි සහතිකය,
5. මෑතකදී ගත් චරිත සහතික 02ක්,
6. වෘත්තීය සුදුසුකම් සම්බන්ධ සහතික,
7. පොලිස් වාර්තාව.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම නාවලපිටිය නගර සභාවේ ලේකම් සතුය.

මෙම නිවේදනයේ සිංහල, දෙමළ අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, සිංහල නිවේදනයට අනුව අදළ කරුණු බලපැවැත්වේ.

ලේකම්,
නගර සභාව,
නාවලපිටිය.

2019 ජුනි මස 25 වැනි දින,
නාවලපිටිය නගර සභාවේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**නාවලපිටිය නගර සභාවේ රියදුරු තනතුර සඳහා ඉල්លුම් කිරීමේ අයදුම්පත්‍රය**

විවෘත ☐

සීමිත ☐

1. මුලකුරු සමග නම :——————————————.

2. සම්පූර්ණ නම :——————————————

3. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————

4. උපන් දිනය වර්ෂය :—————— මාසය:—————— දිනය:——————

5. අයදුම්පත් භාර ගන්නා දිනට වයස ඃ අවුරුදු:———— මාස:———— දින:————
6. ස්ත්‍රී/පුරුෂ භාවය
7. විවාහක/අවිවාහක බව :————————————.
8. ජාතිය :————————————.
9. ස්ථිර ලිපිනය:——————————.
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචි වීමෙන්ද? යන බව :————————.
11. අධ්‍යාපන සුදුසුකම් :

අ. පො. ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :

පළමු වතාව :

වර්ෂය හා මාසය :————
විභාග අංකය :————

දෙවන වතාව :

වර්ෂය හා මාසය:————
විභාග අංකය:————

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1 | | 1 | |
| 2 | | 2 | |
| 3 | | 3 | |
| 4 | | 4 | |
| 5 | | 5 | |
| 6 | | 6 | |
| 7 | | 7 | |
| 8 | | 8 | |
| | | | |

12. වෘත්තීය සුදුසුකම් :……………………………………………………………………………………
……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………
13. පළපුරුද්ද :……………………………………………………………………………………
……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………
14. ඔබ දැනටමත් රාජ්‍ය සේවයේ පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටින්නේ නම්,

14.01 සේවය කරන දෙපාර්තමේන්තුව/ආයතනය :——————.

14.02 දැනට දරන තනතුර:——————.

14.03 එම තනතුරට පත් වූ දිනය:——————.

මෙම අයදුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් පැහැදිලිව දන්වමි.

——————.

අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

*දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ...................................මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ස්ථිර/තාවකාලික/අනියම්/ආදේශක වශයෙන් සේවය කරන බව සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බව කාරුණිකව දන්වමි.

____________________.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :____________________.